# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2217/2 - 2021 මාර්තු මස 01 වැනි සඳුදා - 2021.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) A

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමය මගින්, 2019 ජූනි මස 03 වැනි දින අංක 2126/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත, 2005 ජූලි මස 08 වැනි දින අංක 1400/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පිහිටුවමින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

(1) එහි I වන තීරයේ දැක්වෙන "නර්තන හා නාට්‍ය කලා පීඨය" යන අයිතමයට අනුරූපීව එහි II වන තීරයේ දැක්වෙන "නර්තන රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් :

"ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය"

(2) එම උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "සංගීත පීඨය" යන අයිතමය සහ එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන එහි අනුරූපී සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය සහ සටහන් ආදේශ කිරීමෙන් :-



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**"උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| සංගීත පීඨය | උතුරු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීත අධ්‍යයනාංශය<br>මානව සංගීත විද්‍යා අධ්‍යයනාංශය<br>ව්‍යවහාරික සංගීත හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය<br>දකුණු ඉන්දියානු සංගීත අධ්‍යයනාංශය<br>බටහිර සංගීත අධ්‍යයනාංශය<br>සංගීත විද්‍යා අධ්‍යයනාංශය.". |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 327

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.